# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2022**
**2024 දෙසැම්බර්/ 2025 ජනවාරි**

**සමාජීය විද්‍යා පීඨය**

## දේශපාලන විද්‍යාව
**(නව නිර්දේශය)**

**තුලනාත්මක දේශපාලනය - POLS 28214**

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. තුලනාත්මක දේශපාලනයෙහි ස්වභාවය විස්තර කරමින්, ශාස්ත්‍රීයව තුලනාත්මක දේශපාලනය අධ්‍යයනය කිරීම වර්ධනය වූ ආකාරය විමසන්න. (ලකුණු 20)

02. තුලනාත්මක දේශපාලනය අධ්‍යයනයේ දී භාවිත වන පහත සඳහන් ප්‍රවේශවලට අදාළ ප්‍රකාශ විභාග කරන්න.

    i. "තාර්කික වරණ ප්‍රවේශය (Rational choice approach) යටතේ මානව චර්යාව දේශපාලනයට සිදු කරන බලපෑම අධ්‍යයනය කරයි" (ලකුණු 10)

    ii. "සංස්කෘතික ප්‍රවේශය (Cultural approach) මගින් සංස්කෘතික වටිනාකම් සහ භාවිතයන් දේශපාලනයට කරන බලපෑම අධ්‍යයනය කරයි" (ලකුණු 10)

03. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මගින් රාජ්‍යයක ක්‍රියාකාරිත්වය සඳහා විධිමත් ව්‍යුහයක් සකස් කරන ආකාරය උදාහරණ සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 20)

04. දේශපාලන විධායකය අර්ථ දක්වා අධිකාරිවාදී පාලනතන්ත්‍රය තුළ විධායකයේ ක්‍රියාකාරිත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 20)

05. ඉන්දියානු සහ ඇමරිකා එක්සත් ජනපද ෆෙඩරල් ක්‍රම අතර පවතින වෙනස්කම් පරීක්ෂා කරන්න. (ලකුණු 20)

06. අභිලාෂ කණ්ඩායම් වර්ගීකරණය කරමින් අභිලාෂ ඉටුකර ගැනීම සඳහා ඒවා බලපෑම් කරන ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 20)

07. දේශපාලනය සහ ආණ්ඩුකරණය තුළ කාන්තා සහභාගිත්වය වර්ධනය කිරීම සඳහා අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග විවේචනාත්මකව විග්‍රහ කරන්න. (ලකුණු 20)

08. පහත මාතෘකා අතුරින් දෙකක් (02) තෝරාගෙන සටහන් ලියන්න.

    i. සභාග ආණ්ඩු (Coalition government)
    ii. පූජකතන්ත්‍රය (Theocracies)
    iii. අධිපතිවාදී පක්ෂ ක්‍රමය (Dominant Party System)
    iv. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය
    v. ද්විමාණ්ඩලික ව්‍යවස්ථාදායකය (Bicameral Legislature) (ලකුණු 10x2=20)

***************************